# ඓතිහාසික රම්බාවිහාරයේ උරුම කළමනාකරණයේ ඇති ගැටළු පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

බී. එම් මධුසංඛ බණ්ඩාර*

ලාංකීය ඉතිහාසය තුළ බෞද්ධ උරුමය පිළිබඳව විමසීමේදී වැඩිදෙනෙකුගේ අවධානය රජරටට පමණක් සීමා වූ බව පෙනෙයි.එහෙත් මෙරට සාහිත්‍ය මූලාශ්‍රය වලට අනුව මෙරට බුදු දහම ස්ථාපිත වීමත් සමඟ මුළු රට පුරා එහි ව්‍යාප්තියද සිදුවූ අතර ඒ හරහා වෙහෙර විහාර ඉදි කිරීමේ කලාවද ව්‍යාප්ත වූ බව දක්නට ලැබේ. කෙසේ වෙතත් සාහිත්‍ය මූලාශ්‍රයන්හි මෙවැනි වටිනා තොරතුරු අඩංගු වුවද ඒ අතරින් ඇතැම් ප්‍රදේශ කෙරෙහි පුරාවිද්‍යාත්මක උගතුන්ගේ අවධානය ලැබී ඇත්තේ මඳ වශයෙන් වීම හේතුවෙන් බෞද්ධ උරුමයයන්හි වටිනා පුරාවිද්‍යාත්මක සාධකයන් වර්තමානය වන විට විනාශයට පත්ව ඇති බව පෙනෙන්නට ඇත.

මෙම අධ්‍යයන මාතෘකාවට අදාළ රම්බාවිහාරය ඉපැරණි රුහුණු රටට හෙවත් වර්තමාන දකුණු පළාතට අයත්ව තිබෙයි.අක්කර 250 ක් පමණ වූ භූමි භාගයක විසිරි ව්‍යාප්තව පවතින මෙම සංකීර්ණයට අයත් නටඹුන් සහිත ඉඩම් බොහෝ ප්‍රමාණයක් බලධාරීන්ගේ නිසි අවධානය නොමැති වීම හේතුවෙන් මේ වන විට පෞද්ගලිකරණයට නතුව විනාශ වෙමින් පවතින අතර ඒ අතරින් බොහෝ ප්‍රමාණයක් දැනට විනාශ වී ගොස් අවසන්ය.මෙහි ඇතැම් ස්මාරක කිහිපයක් පුරා විද්‍යා දෙපාර්තමෙන්තුව විසින් කැණිම් කොට සංරක්ෂණය කර තිබුනද එතුළින් උරුමය සුරක්ෂිත වීම සිදු වී ඇත්තේ එක් සීමාවකට පමණක් බව පෙනෙයි. මේ හෙයින් රම්බාවිහාරයේ උරුමයේ හෙට දවස පිළිබඳ ගැටළු රාශියක් වර්තමානය වන විට උද්ගතව තිබෙයි. මේ හෙයින් පෞඩ ඉතිහාසයක තොරතුරු හෙළි වන මෙම ස්ථානය උරුමය කළමණාකරනයේ ඇති වැදගත් කම පිළිබඳව දැනුවත්ව එය විනාශ මුඛයෙන් ගලවා ගැනීම වර්තමාන වගකිවයුත්තන්ගේ යුතුකමක්ව පවතින බව පෙන්වා දීම කළ යුතුව පවතී.වර්තමානයේ මෙම ස්ථානය සම්බන්ධව කරන ලද සහභාගීත්ව නිරීක්ෂණයන්, හා කරන ලද පූර්ව පුරාවිද්‍යාමක ගවේෂනයන්ගෙන් ලද තොරතුරු ඇසුරු කරමින් දැනට මෙම ආරාම සංකීර්ණයේ උද්ගතව ඇති උරුම කළමණාකරනය පිළිබඳව උද්ගතව පවතින ගැටළු හඳුනා ගෙන ඒ සඳහා නව යෝජනා ඉදිරිපත් කිරීමට මෙම පරීක්ෂණය මගින් අපේක්ෂා කරන අතර පුරාවිද්‍යාත්මක දෘෂ්ඨියකින් කරනු ලබන මෙම පර්යේෂණයේ මූලික අරමුණ ඉතිහාසයෙන් සැඟවී යන බෞද්ධ උරුමයන්හි වැදගත්කම පහදාදීම වෙයි.

ප්‍රමුඛ පද- රම්බාවිහාරය, බෞද්ධ උරුමය, උරුම කළමනාකරණය

* ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය basnayakamaduanka@gmail.com